පිටරට පැටවුණ සිංහල වදන්

පද්මා එදිරිසිංහ

රොබට් නොක්ස් අපට ඉතා හුරු නමකි. වසර 20 කට ආසන්න කාලයක් ලංකාවේ සිරබත් කෑවකු වශයෙන් ද ඉන් පසු ලෝ සුපතළ ග්‍රන්ථ කර්තෘවරයෙකු වශයෙන් ද නමක් ශේෂ කොට ස්වර්ගස්ථ වූවෙකි ඔහු.

එහෙත් ඔහු කළ තවත් වීර වීදුමයක් මේ ලිපියෙන් හෙළි කරමි. එය නම් සිංහල වචන ඇසුරෙන් ප්‍රථම ශබ්ද කෝෂය තැනීමට යත්න දැරූ අපරදිග ජාතිකයා වශයෙන් ද නමක් තැබී ම ය .

ඇත්තට ම ශබ්ද කෝෂය යන්න ඔහු ගේ උත්සාහයට අනුපාත ව වඩා උපාරූ වචනයක් විය හැකි ය. බොහෝ අය නොදන්නා කරුණක් නම් නූතන ශබ්ද කෝෂ ලිවීමට ශත වර්ෂ ගණනාවකට පෙරාතුව අපේ ඇත්තන් වචන පිළිබඳ ව කෝෂ ග්‍රන්ථ ලිවීමට ප්‍රවීණ්ට වූ බව යි.

පියුම් මල එවැනි කෝෂ ග්‍රන්ථයකි. ලංකාවෙන් පලා යෑමෙන් පසු ව මේ රට ගැන ලියූ ග්‍රන්ථයේ ජනප්‍රියත්වයෙන් ඔද වැඩුණු ඔහු, ලංකාවෙන් ගෙන ගිය වදන් වැල එක්තැන් කිරීමට ගත් උත්සාහය අනුපාතික වශයෙන් ස්වල්ප ය.

එයට ඔහු පෙළඹවූයේ ද අන් අයෙකි. ඒ රාජකීය සංගමයේ ලේකම් ආචාර්ය හුක් ය. නොක්ස් ගේ ලංකාව ගැන ග්‍රන්ථය එළි දැක්වීමට බෙහෙවින් පුරෝගාමී වූ හුක් ලතින් භාෂාව පිළිබඳ ව ගවේෂණයන්හි යෙදුණු අයෙක් විය.

නොක්ස් සඳහන් කළ ඇතැම් සිංහල යෙදුම් හා අපරදිග භාෂා යෙදුම් අතර කිසියම් සමතාවක් ඔහු දුටුවේ ය. මෙසේ විද්වතුන් ඊට වසර 150 කට පමණ පසු එළැඹුණු නිගමනයකට මේ දෙදෙන පාර කැපූහ.

නිගමනය නම් සිංහලය ඉන්දු යුරෝපීය භාෂා ගණයට අයත් බව ය. එය කළේ ගම්භීර ශාස්ත්‍රීය පරිසරයක ද නො වේ. කෝපි කඩයක ය. එකල නැතිනම් 17 වන ශත වර්ෂයේ තව ම සමාජ ශාලා වැනි දේ බිහි වී නැත.

යම් යම් දේ ගැන සාකච්ඡා කිරීමට රිසි වූ උගත්තු නිවසකට හෝ කෝපි කඩයකට රැස් වෙති.

එහෙත් මේ දෙපළ යට කී ලෝ සුපතළ ග්‍රන්ථය කෙටුම් පත් කළේ ද පසු සාකච්ඡා පැවැත්වූයේ ද ලන්ඩනයේ ගැරවේස් නම් වූ තරමක ඉහළ පෙළේ කෝපි කඩයක ය.

නොක්ස් මෙරට 20 වසක් සිටිය ද ඔහු සිංහල ලිවීමට හෝ කියැවීමට නොදන්නේ ඔහු මෙහි දී බෙහෙවින් නූගත් ගැමියන් ගේ ඇසුරට වැටුණු හිසා යයි සිතිය හැකි ය.

තව ද තමා අළුලා සිර කළ ජාතියක බස ආයා-සයෙන් ඉගෙන ගැනීමට ද අවශ්‍යතාවක් නො වී ය. එහෙත් වසර ගණනාවක් ඒ බස ඔහු ගේ කන වැකිණි.

මිතුරකු සමග ඔහු පලා ගියේ අරිප්පු වරායට සෙ-න්දු වූ ලන්දේසි නැවකිනි. මේ වරායේ සිදුවීම සටහන් තැබුවකු සිංහල බස හොඳින් කතා කළ හැකි එහෙත් තමන් ඉංග්‍රීසි ජාතිකයන් යැයි කියා ගන්නා සිංහල ගැමි ඇඳුමින් සැරැසුණු දෙදෙනකු එදින වරායට අවුත් සිය රටට යෑමට ආධාර ඉල්ලූ බව වාර්තා කර ඇත.

හුක් ද නොක්ස් ගැන මෙසේ ලියා තිබේ. "මවු බස පමණට ම සිංහල වතුර ලෙස කතා කිරීමේ හැකියාවක් ඔහු දැක්වී ය. එම බස ගැන සම්පූර්ණ දැනුමක් ඔහු සතු ය."

පුල්ස්කැප් කොළ කිපයක ලියන ලද මේ වචන ලියා ඇත්තේ ඉංග්‍රීසි අකුරු මාධ්‍යයෙනි. ඇතැම් වචන හුක් ගේ අත් අකුරින් ද ඇතැම් වචන නොක්ස් ගේ අත් අකුරින් ද ලියා ඇත. නොක්ස් වචනය ශබ්ද කරන විට හුක් එය ලියූ බව සිතිය හැකි ය.

මේ ලේඛනය එතරම් පරිස්සමෙන් නොකරන ලද බව සිතිය හැක්කේ නොක්ස් සිය ග්‍රන්ථයේ පාවිච්චි කරන සිංහල වචන කිපයක් මෙහි අඩංගු නොවීම නිසා ය.

හුක් ක්‍රමයෙන් රෝගී වීම හා මිය යෑම ද නොක්ස් නැවතත් මුදු ගමන් අරඹමින් ටොන්ක්වින් මර්චන්ට් නම් නැවේ කප්පිත්තා බවට පත්වීම ද නිසා මේ කර්තව්‍යය තවත් අඩාල විය.

නොක්ස් නම් අපූරු චරිතයකි. වරක් සිරකරුවකු ව සිටි ඔහු මේ නැවේ වහලූන් පටවා ගෙන එහාට

මෙහාට ලොව පුරා කරක් ගැසුවේ අතීතය අමතක කරමිනි.

සිය ලංකා ග්‍රන්ථයේ අලෙවිය නිසා ද මුදු ගමන් නිසා ද ධන කුවේරයකු බවට පත් වුව ද තමා හා විවාහ වීමට රිසි කාන්තාවන් පිළිකුල් කරමින් ඔහු මරණය දක්වා ම අවිවාහක ජීවිතයක් ගත කළේ ය.

සිංහල කෝෂ ග්‍රන්ථය කාටත් අමතක වූවා පමණක් නො ව එයට කුමක් වූවා දැ යි කිසිවෙක් නොදත්තේ ය.

අන්තිමේ දී ශත වර්ෂ දෙකකට පසු ලංකාව හා සම්බන්ධ යුරෝපීය පවුලක් වූ පර්ගසන් පවුල් ඩොනල්ඩ් පර්ගසන් නමැත්තා බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ආචාර්ය හුක් එයට ප්‍රදානය කළ ලියැවිලි පිරික්සීමේ දී මේ ලේඛනය හමු වී ඇත.

මේ ලිපියේ මාතෘකාවේ වචන 736 ක් ගැන සඳහන් වේ. එහෙත් ඒ වචන සියල්ල ම මේ ලේඛනයේ නැත. හත්සිය තිස් හය සමන්විත වන්නේ "ගිස-ටරිකල් රිලේෂන්ස් ඔෆ් සිලෝනී" යන ග්‍රන්ථයේ ඇතුළත් සිංහල වචන හා ලේඛනයේ වචන එකතුවෙනි.

ග්‍රන්ථගත වචන හෝ ශාස්ත්‍රීය වචන හෝ උගතුන් අතර ව්‍යවහාර වූ වචන මේ ලේඛනයේ නැත. ඊට හේතු කලින් සඳහන් කර ඇත. උදාහරණ කිපයකි අම්බලම, පූජා, තොරණ, බුද්ධ, බෝ දිසාව, ගවුර් (ගවර හෙවත් හරකා) ඉලූක්, කබරගොයා, කිතුල්, කුරක්කන්, මුරුංගා, පෙරහර, පාළඟා, රිලව්, වැද්දා, විහාර, කංගානි.

"කංගානි" යන වචනය වතුවැවිලි ආර්ථිකය සමග ලංකාවට පිවිසි වචනයක් ලෙස සැලකුණ ද 17 වන සියවසේ ද එය ඒ අර්ථයෙන් ම පාවිච්චි වී ඇත. රිචඩ් බොයිල් ලියූ ග්‍රන්ථයේ මේ වචන ගැන වැඩි විස්තර සඳහන් වේ.

දැනට ලංකාවේ වෙසෙන මේ කර්තෘ තම පොතේ සඳහන් නොකළ ද ලේඛිකාව ගේ අවධානයයට යොමු වුණු කරුණක් ඇත. එනම් ගැරවේසී කෝපි කඩේ ලංකාව ගැන කතා බහේ යෙදුණු වසර 300 කට කලින් ජීවත් වූ ලන්ඩනයේ සුද්දන් අතර රොබට් බොයිල් නම් අයකු ද වූ බව යි. ඇතැම් විටෙක මේ රොබට් බොයිල්, රිචඩ් බොයිල් ගේ මිමුත්තකු විය හැකි ය.

මේ අතර ලන්ඩනයේ කෝපි කඩයක වාඩි වී සිංහල වදන් වැලකින් නූතන පියුම් මලක් පිපෙන්නට ඉඩ සැලසූ නොක්ස් හා හුක් යන දෙදෙන ද අපූරු චරිත දෙකකි. 17 වන සියවසේ දෙවැනි රාසිත්හයන්ගේ රාජ්‍ය ක්ෂේත්‍රයේ කඩතුරාව ද ඔවුහු නිරාවරණය කළහ.

EASE YOUR TAX BURDEN, ENHANCE YOUR WEALTH

SANDAL
TAX ADVISORS PTY LTD

- TAX RETURNS
- ACCOUNTING AND BOOKKEEPING
- TAX PLANNING
- BAS AND IAS
- BUSINESS AND COMPANY REGISTRATION
- SELF-MANAGED SUPER FUND ACCOUNTING
- SET UP COMPANY, TRUST & SMSF
- FBT, WORK COVER, PAYROLL TAX, SUPERANNUATION
- BUSINESS CONSULTING

Amal Ramyanath CPA, ACA, MBA & B.Sc
Chartered Tax Advisor / Registered Tax Agent
31 Madeline St Glen Waverley VIC 3150
Tel 8802 8818 Mob 0412 775 889 Fax 8802 8644
Email sandalmanagement@optusnet.com.au
primehomeloans@live.com

PRIME
HOME LOANS PTY LTD

FBAA Finance Brokers Association of Australia ACCREDITED MEMBER

SPECIALISED SERVICE FOR HOME & COMMERCIAL LOANS

- INVESTMENT PROPERTY
- FIRST HOME BUYERS
- CONSTRUCTION
- REFINANCE / DEBT CONSOLIDATION
- COMMERCIAL PROPERTY FINANCE

Craigieburn Office
Aruna Colombathantri
Chartered Accountant (SL), LL.B(SL), CPA(Aus), MIPA (Aus), MCSI (UK)
2 Elland Court Craigieburn Vic 3064
Mob 0439 630 358
Email arunaeysl@gmail.com

GUSS DESIGN 9769 0099